ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2019 ජනවාරි මස 28 දින** |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 නොවැම්බර්

### සමස්ත නිරීක්ෂණ

- ආනයන වියදම කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කිරීම සමඟ 2018 නොවැම්බර් මාසයේදී වෙළඳ ගිණුමේ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු විය.
- 2018 නොවැම්බර් මාසයේදී අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.1 කින් ඉහළ ගිය අතර, ආනයන සියයට 9.1 කින් පහළ ගියේය.
- සංචාරකයින් වැඩි ප්‍රමාණයක් පැමිණෙන කාලය ආරම්භ වීමත් සමඟ 2018 නොවැම්බර් මාසයේදී සියයට 18.2 ක වර්ධනයක් වාර්තා කරමින් සංචාරක ඉපැයීම් නැවත ශක්තිමත් ලෙස ඉහළ ගියේය. 2019 වසර පුරා සංචාරක අංශය සිය ශක්තිමත් කාර්යසාධනය අඛණ්ඩව පවත්වාගනු ඇතැයි අපේක්ෂිතය.
- සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2018 නොවැම්බර් මාසයේදී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5.7 කින් අඩු වූ අතර, සමුච්චිත ලෙස සැලකීමේදී සියයට 0.9 ක අඩුවීමක් වාර්තා කළේය.
- දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත පීඩනය ඉහළ නංවමින් 2018 නොවැම්බර් මාසය තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ආපසු රැගෙන යෑම් හේතුවෙන් විනිමය අනුපාතිකයේ ඇති වූ දැඩි විචලනයන් අවම කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය.
- 2018 නොවැම්බර් මාසය අවසානය වන විට රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.7 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.0 ක මට්ටමක පැවතුණි.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 නොවැ. (එ.ජ. ඩො. මිලියන) | 2018 නොවැ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන -නොවැ. (එ.ජ. ඩො. මිලියන) | 2018 ජන -නොවැ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 941 | 980 | 4.1 | 10,341 | 10,856 | 5.0 |
| ආනයන | 1,940 | 1,765 | -9.1 | 18,931 | 20,498 | 8.3 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -999 | -785 | | -8,590 | -9,642 | |
| සංචාරක ඉපැයීම් (ආ) | 311 | 367 | 18.2 | 3,471 | 3,905 | 12.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 588 (ඇ) | 555 | -5.7 | 6,493 (ඇ) | 6,431 | -0.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -11 | -30 | | 267 | -29 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 337 | 83 | | 5,327 | 4,937 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 140 | - | | 1,543 | 698 | |
| දිගුකාලීන ණය | 197 | 83 | | 1,284 | 739 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | - | - | | 1,000 | 1,000 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500 | 2,500 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 167 | 252 | |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | | | | 693 | 1,801 | |
| සමස්ත ශේෂය | | | | 2,005 | -807 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම අනුව සංශෝධිතය.

(ඇ) සංශෝධිත

(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

- ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටීම සහ අපනයන ආදායම මධ්‍යස්ථ ලෙස වර්ධනය වීම හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදී වෙළඳ හිඟය 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස අඩු විය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකූ විට 2018 වසරේ පළමු මාස එකොළහ තුළදී වෙළඳ හිඟය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුළුල් විය.
- මේ අතර, අපනයනවලට සාපේක්ෂව ආනයනවල මිල නිරූපණය කරන වෙළඳ මිල දර්ශකය, අපනයන මිල ගණන් ඉහළ යෑම සහ ආනයන මිල ගණන් සුළු වශයෙන් පහත වැටීම හේතුවෙන්, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2018 නොවැම්බර් මාසයේදී දර්ශකාංක 112.8 ක් දක්වා සියයට 1.6 කින් වර්ධනය විය.

**රූප සටහන 1 : මාසික වෙළඳ ක්‍රියාකාරිත්වය - 2018**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2 : වෙළඳ මිල අනුපාතය - 2018**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2018 නොවැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 980 ක් දක්වා සියයට 4.1 කින් මධ්‍යස්ථව වර්ධනය විය. කාර්මික අපනයනවල සිදු වූ වර්ධනය මෙම වර්ධනය සඳහා හේතු වූ අතර, කෘෂිකාර්මික අපනයන අඛණ්ඩව පහත වැටුණි.
- කාර්මික අපනයන සැලකූ විට, 2018 නොවැම්බර් මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදුකළ අපනයන ඉහළයෑම ඒ සඳහා හේතු විය. මීට අමතරව, ඉන්දියාව, කැනඩාව සහ ඕස්ට්‍රේලියාව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සහ යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ රෙදිපිළි සහ අනෙකුත් නිමකළ රෙදිපිළි ද්‍රව්‍ය අපනයන ඉහළ යෑම සමඟද ඇඟලුම් අපනයන වර්ධනය විය. නැව් සහ ගුවන්යානා සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන පරිමාව 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව සුළු වශයෙන් පහත වැටුණද, එහි අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය විය. සියලුම උප කාණ්ඩවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදී යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ ගියේය. තවද, 2018 නොවැම්බර් මාසයේදී කාර්මික අපනයන ඉහළ යෑම සඳහා දායක වෙමින් ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදිත හා මූලලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම් ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 නොවැම්බර් මාසයේදී මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම් පහත වැටුණි.
- සකස් නොකළ දුම්කොළ සහ එළවළු හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති උප කාණ්ඩ සියල්ලකම පාහේ වූ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙම මාසයේදී

කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් සහ අපනයන පරිමාව අඩුවීම පිළිබිඹු කරමින් 2018 නොවැම්බර් මාසයේදී තේ අපනයන ආදායම පහත වැටුණි. කුළුබඩු යටතේ වර්ග කර ඇති බොහෝ කාණ්ඩවල අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් මෙම මාසය තුළදී කුළුබඩු අපනයන ආදායම පහත වැටුණි. තවද, පොල්මද ආශ්‍රිත සහ පොල්මද ආශ්‍රිත නොවන යන කාණ්ඩ දෙකටම අයත් නිෂ්පාදිත අපනයන අඩුවීම හේතුවෙන් පොල් අපනයන ආදායම පහත වැටුණි. 2018 නොවැම්බර් මාසයේදී මුහුදු ආහාර අපනයන ආදායම පහළ ගිය අතර, සමුච්චිත වශයෙන් සැලකූ විට යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන ඉහළ යෑම හේතුවෙන් පළමු මාස එකොළහ තුළ එහි වර්ධනයක් වාර්තා කළේය.

- 2017 නොවැම්බර් මාසයේදී වාර්තා වූ අපනයන පරිමාව සහ අපනයන මිල දර්ශකවලට සාපේක්ෂව 2018 නොවැම්බර් මාසයේදී අපනයන පරිමා දර්ශකය සියයට 2.9 කින්ද, අපනයන මිල දර්ශකය සියයට 1.1 කින් වර්ධනය වූ අතර මෙම මාසයේදී අපනයන වර්ධනය සඳහා මිල ගණන් ඉහළ යෑමට වඩා පරිමාව ඉහළ යෑම හේතු වූ බව මෙයින් පිළිබිඹු වේ.

**රූප සටහන 3 : මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන් : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4 : අපනයන පරිමා දර්ශකය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2017 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2018 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **713.5** | **787.9** | **10.4** | **7,745.6** | **8,444.9** | **9.0** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 28.4 | 33.9 | 19.1 | 359.8 | 423.8 | 17.8 |
| සත්ත්ව ආහාර | 8.0 | 8.5 | 5.8 | 70.2 | 99.6 | 41.9 |
| රෙදිපිළි හා ඇඟලුම් | 424.3 | 469.8 | 10.7 | 4,562.0 | 4,824.3 | 5.7 |
| එයින් ඇඟලුම් | 399.0 | 438.5 | 9.9 | 4,294.1 | 4,501.2 | 4.8 |
| රෙදිපිළි | 17.7 | 22.5 | 26.9 | 188.0 | 235.9 | 25.5 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.6 | 8.8 | 15.2 | 79.8 | 87.2 | 9.3 |
| රබර් නිෂ්පාදිත | 67.3 | 71.3 | 5.9 | 760.8 | 798.9 | 5.0 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 22.5 | 20.3 | (9.7) | 236.7 | 259.1 | 9.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 28.3 | 37.4 | 32.3 | 340.8 | 401.6 | 17.8 |
| ප්‍රවාහන උපකරණ | 6.6 | 6.4 | (2.3) | 157.6 | 111.9 | (29.0) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 44.2 | 56.9 | 28.8 | 371.9 | 569.2 | 53.0 |
| රසායනික නිෂ්පාදිත | 11.8 | 12.0 | 1.6 | 134.0 | 153.6 | 14.6 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.6 | 11.9 | 3.3 | 126.2 | 128.8 | 2.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 4.4 | (33.2) | 44.5 | 29.3 | (34.3) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 12.9 | 10.8 | (15.9) | 144.2 | 139.0 | (3.7) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.8 | 6.4 | (6.8) | 66.5 | 70.3 | 5.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 11.8 | 14.6 | 23.7 | 105.7 | 153.1 | 44.8 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.7 | 2.6 | (5.1) | 30.8 | 29.3 | (5.0) |
| වෙනත් | 19.7 | 20.7 | 5.1 | 233.8 | 253.3 | 8.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **224.1** | **187.8** | **(16.2)** | **2,547.5** | **2,362.7** | **(7.3)** |
| තේ | 127.0 | 103.2 | (18.8) | 1,402.9 | 1,311.4 | (6.5) |
| රබර් | 2.3 | 2.2 | (5.1) | 35.7 | 29.7 | (16.7) |
| පොල් | 25.7 | 20.5 | (20.5) | 329.0 | 287.1 | (12.7) |
| කුළුබඩු | 33.7 | 27.7 | (17.7) | 373.6 | 330.3 | (11.6) |
| එළවළු | 1.8 | 2.1 | 19.5 | 26.4 | 26.1 | (1.4) |
| සකස් නොකළ දුම්කොළ | 1.9 | 2.3 | 19.8 | 31.5 | 31.5 | (0.1) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.9 | 7.6 | (15.3) | 129.3 | 110.0 | (14.9) |
| මුහුදු ආහාර | 22.8 | 22.3 | (2.3) | 219.1 | 236.6 | 8.0 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.3** | **3.9** | **17.2** | **47.8** | **48.6** | **1.6** |
| **මුළු අපනයන** | **940.9** | **979.6** | **4.1** | **10,340.9** | **10,856.2** | **5.0** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2017 ජූනි මාසයට පසුව ප්‍රථම වතාවට 2018 නොවැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,765 ක් දක්වා සියයට 9.1 කින් පහත වැටුණි. පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථ වාහන සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන මත සීමා පැනවීමෙන් වූ බලපෑම පිළිබිඹු කරමින් පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන පහළ යෑම ආනයන වියදම පහත වැටීම සඳහා හේතු වූ අතර, ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂව විශාල වශයෙන් අවප්‍රමාණය වීම ද ආනයන අඩුවීම සඳහා හේතු විය හැකිය.
- සහල්, එළවළු, කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා සීනි ආනයන අඩු වීමත් සමඟ ආහාර හා පාන වර්ග ආනයන වියදම පහත වැටීම හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස පහත වැටුණි. දේශීය නිෂ්පාදනය ඉහළයෑම හේතුවෙන් ආනයන පරිමාව අඩුවීම සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම, මෙලෙස ආහාර හා පාන වර්ග ආනයන වියදම අඩුවීම සඳහා හේතු විය. විදුලි සංදේශ උපකරණ සහ ගෘහ උපකරණ වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ වර්ග කිහිපයක් සඳහා ක්‍රියාත්මක කළ ආනයන සීමා කිරීමද මේ සඳහා යම් තරමකට දායක විය. පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයනය පාලනය සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් 2018 නොවැම්බර් මාසයේදී එම රථවාහන ආනයන වියදම පෙර මාසයට සාපේක්ෂව සියයට 34.8 කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉදිරි මාසවලදී තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- බොහෝ උප කාණ්ඩ යටතේ වූ ආනයන පහළ යෑම හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. විශේෂයෙන්ම 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව සිමෙන්ති සහ වාණිජ අරමුණු සඳහා භාවිතයට ගනු ලබන රථවාහන ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි.
- මෙයට වෙනස්ව යමින්, ඉන්ධන, මූල ලෝහ සහ පොහොර ආනයන ඉහළ යෑම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් වුවද ඉහළ ගියේය. බොර තෙල් ආනයන පරිමාවෙහි අඩුවීමක් වාර්තා වුවද, පිරිපහදු කළ ඛනිජතෙල් සහ ගල්අඟුරු ආනයන මිල ගණන් සහ ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, යකඩ හා වානේ ආනයනය ඉහළ යෑම හේතුවෙන් මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, රත්‍රන් ආනයන මත 2018 අප්‍රේල් මාසයේදී පනවන ලද තීරුබද්ද හේතුවෙන් 2018 නොවැම්බර් මාසයේදීද රත්‍රන් ආනයන වියදම අඛණ්ඩව කැපී පෙනෙන ලෙස පහත වැටුණි. ප්‍රධාන වශයෙන්ම, ආනයන පරිමාව අඩුවීම හේතුවෙන් මෙම මාසය තුළදී තිරිඟු හා ඉරිඟු ආනයන වියදමද පහත වැටුණි. ආනයන වියදම

මත වන පීඩනය අඩු කිරීමට දායක වෙමින් මෙම මාසය තුළ ඛනිජමය නිෂ්පාදිත සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදමද පහත වැටුණි.

- 2018 නොවැම්බර් මාසයේදී ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය පිළිවෙළින් සියයට 8.6 කින් සහ සියයට 0.5 කින් පහත වැටුණි. මේ මගින් මෙම මාසයේ ආනයන පහළ යෑම සඳහා 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයනය කළ භාණ්ඩවල මිල ගණන් අඩුවීමට වඩා ආනයන පරිමාව අඩුවීම හේතු වූ බව පෙන්නුම් කෙරේ.

**රූප සටහන 5 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලය : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6 : ආනයන පරිමා දර්ශකය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7 : පෞද්ගලික රථ වාහන ආනයනය වියදම - 2018**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2018 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස % | 2017 ජන - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන - නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස % |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **407.7** | **363.5** | **(10.8)** | **4,069.0** | **4,622.7** | **13.6** |
| ආහාර හා පාන වර්ග | 174.9 | 111.0 | (36.5) | 1,659.5 | 1,471.4 | (11.3) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 26.2 | 3.2 | (87.7) | 272.1 | 121.2 | (55.4) |
| එයින් සහල් | 25.3 | 1.4 | (94.5) | 260.2 | 103.9 | (60.1) |
| කිරි නිෂ්පාදිත | 40.6 | 25.4 | (37.5) | 291.0 | 299.0 | 2.8 |
| එළවළු | 39.4 | 21.8 | (44.8) | 327.4 | 277.9 | (15.1) |
| මුහුදු ආහාර | 15.5 | 15.9 | 2.5 | 199.2 | 182.4 | (8.4) |
| සීනි හා රසකැවිලි | 20.0 | 13.4 | (33.3) | 233.8 | 223.4 | (4.4) |
| කුළුබඩු | 6.4 | 8.6 | 33.0 | 84.4 | 104.1 | 23.4 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 26.7 | 22.8 | (14.4) | 251.7 | 263.3 | 4.6 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 232.8 | 252.5 | 8.5 | 2,409.4 | 3,151.2 | 30.8 |
| පෞද්ගලික රථවාහන | 62.2 | 104.9 | 68.7 | 677.4 | 1,496.2 | 120.9 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 51.1 | 46.5 | (9.0) | 474.4 | 488.6 | 3.0 |
| ගෘහ උපකරණ | 23.4 | 16.8 | (28.3) | 239.6 | 216.0 | (9.8) |
| රෙදිපිළි හා උපාංග | 25.7 | 23.2 | (9.7) | 344.9 | 283.4 | (17.8) |
| විදුලි සංදේශ මෙවලම් | 31.3 | 24.1 | (22.8) | 254.0 | 250.9 | (1.2) |
| ගෘහ හා දැව භාණ්ඩ | 16.9 | 12.8 | (24.5) | 169.5 | 156.4 | (7.7) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 22.2 | 24.2 | 9.2 | 249.7 | 259.7 | 4.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,072.5** | **1,074.6** | **0.2** | **10,242.0** | **11,504.9** | **12.3** |
| ඉන්ධන | 306.4 | 403.6 | 31.7 | 2,994.6 | 3,834.6 | 28.0 |
| එයින් බොරතෙල් | 95.7 | 110.7 | 15.7 | 608.3 | 886.7 | 45.8 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 185.2 | 245.6 | 32.6 | 2,167.4 | 2,750.2 | 26.9 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 82.7 | 9.9 | (88.1) | 677.0 | 552.7 | (18.4) |
| එයින් රත්‍රන් | 72.7 | 0.1 | (99.9) | 570.7 | 438.7 | (23.1) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 251.1 | 245.7 | (2.1) | 2,491.7 | 2,617.0 | 5.0 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 44.9 | 45.4 | 1.2 | 444.5 | 486.8 | 9.5 |
| ඛනිජ නිෂ්පාදිත | 35.5 | 12.8 | (63.8) | 201.5 | 171.0 | (15.1) |
| තිරිඟු හා ඉරිඟු | 58.2 | 22.0 | (62.1) | 353.9 | 348.6 | (1.5) |
| මූල ලෝහ | 40.9 | 77.0 | 88.1 | 503.5 | 596.8 | 18.5 |
| වාහන හා යන්ත්‍රෝපකරණ | 24.5 | 25.7 | 4.9 | 269.3 | 273.9 | 1.7 |
| රසායනික නිෂ්පාදිත | 72.1 | 73.2 | 1.5 | 762.1 | 834.3 | 9.5 |
| පොහොර | 4.9 | 24.6 | 403.6 | 86.7 | 235.6 | 171.8 |
| ආහාර සැකසුම් | 31.3 | 21.0 | (33.0) | 277.1 | 275.1 | (0.7) |
| වෙනත් | 119.9 | 113.6 | (5.2) | 1,180.1 | 1,278.5 | 8.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **459.7** | **326.0** | **(29.1)** | **4,475.9** | **4,296.4** | **(4.0)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 243.6 | 179.5 | (26.3) | 2,391.0 | 2,291.6 | (4.2) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 157.6 | 103.9 | (34.1) | 1,460.5 | 1,383.2 | (5.3) |
| ප්‍රවාහන උපකරණ | 57.9 | 42.1 | (27.3) | 617.0 | 615.9 | (0.2) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.5 | 0.1 | 7.4 | 5.6 | (23.7) |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **0.5** | **0.7** | **144.4** | **74.2** | **(48.6)** |
| **මුළු ආනයන** | **1,940.4** | **1,764.6** | **(9.1)** | **18,931.3** | **20,498.1** | **8.3** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- ජර්මනිය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවලින් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් 2017 වසරේ නොවැම්බර් මාසයට සාපේක්ෂව 2018 වසරේ නොවැම්බර් මාසයේදී සංචාරක පැමිණීම් සියයට 16.8 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2018 වසරේ පළමු මාස එකොළහ තුළදී සංචාරක පැමිණීම් ප්‍රමාණය 2,080,627 ක් වූ අතර, එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට වඩා සියයට 11.2 ක වර්ධනයකි. 2018 නොවැම්බර් මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 367 ක්වූ සංචාරක ඉපැයීම් සමඟ 2018 වසරේ පළමු මාස එකොළහ තුළදී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 3,905 ක් ලෙස වාර්තා විය.
- 2018 නොවැම්බර් මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 555 ක් දක්වා වාර්ෂික පදනම මත සියයට 5.7 කින් පහළ ගියේය. සමුච්චිත පදනම මත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,431 ක් දක්වා සියයට 0.9 කින් පහළ ගියේය.

**රූප සටහන 8 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




**මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**රූප සටහන 9 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**බලපත්‍රලාභී වාණිජ බැංකු**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

## මූල්‍ය ලැබීම්

- 2018 නොවැම්බර් මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ගෙවීම් වාර්තා විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් අඛණ්ඩව විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම පිළිබිඹු කරමින් නොවැම්බර් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 162 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, ඒ සමඟ 2018 වසරේ පළමු මාස එකොළහ තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත ශුද්ධ ගෙවීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 802 ක් දක්වා ඉහළ ගියේය.
- ද්විතීයික හා ප්‍රාථමික වෙළඳපොළ විදේශ විනිමය ගනුදෙනු අන්තර්ගත කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2018 නොවැම්බර් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 30 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. ඒ අනුව, 2018 වසරේ පළමු මාස එකොළහ තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත ශුද්ධ ගෙවීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 29 ක් වූ අතර, එය ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ. ජ. ඩොලර් මිලියන 77 ක ලැබීමකින් සහ ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 106 ක ශුද්ධ ගෙවීමකින් සමන්විත විය. 2018 නොවැම්බර් මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ. ජ. ඩොලර් මිලියන 3.3 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2018 නොවැම්බර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.0 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ආනයනික මාස 3.7 කට සමාන විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2018 නොවැම්බර් අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 9.7 ක් වූ අතර, එය ආනයනික මාස 5.2 කට සමාන විය.

**රූප සටහන 10 : දළ නිල සංචිත සහ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ ජනවාරි මස 28 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 0.6 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, යුරෝ හා ඉන්දියානු රුපියල හැර අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අවප්‍රමාණය විය.
- 2018 වසර තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 16.4 කින් අවප්‍රමාණය වූ අතර, අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂවද අවප්‍රමාණය විය.

**රූප සටහන 11 :**

**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**

**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 ජන.28 දක්වා අතිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% |
| යුරෝ | -12.7% | +0.8% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -3.2% |
| ජපන් යෙන් | -18.1% | -0.3% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -2.4% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | -1.4% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.1% |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව